BRITISH COUNCIL

සිසු සිසුවියන් හා දෙමාපියන් සඳහා වන චර්යාධර්ම සංග්‍රහය

# බ්‍රිතාන්‍ය කවුන්සිල ඉගැන්වීම් මධ්‍යස්ථානයේ(learning hub) virtual පංති

www.britishcouncil.org

# Virtual පාඩම්

සිසු සිසුවියන් සඳහා වන ඉගැන්වීමේ අත්දැකීම් අන්තර්ජාලය හරහා පවත්වන පංති කාමරයක (virtual classroom) දී පැවැත්වේ. Virtual පාඩම් නිර්මාණය කර ඇත්තේ සිසු සිසුවියන් තුළ ආත්ම-විශ්වාසය ගොඩනැගීමට, කථාව පුහුණුවීමට, කුසලතා සංවර්ධනයට මෙන්ම සාමාන්‍ය පංතියක දී සේ ම ප්‍රගතිය ඇති කිරීමට උපකාරී වන අන්දමට ය.

# Virtual පංති සඳහා චර්යාධර්ම සංග්‍රහය

Virtual පංති වලට සහභාගි වන සිසු සිසුවියන් තමන්ගේ හැසිරීම සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කළ යුතු අතර, මුහුණට-මුහුණ ලා කටයුතු කරන පංතියක දී අනුගමනය කරන සියලු ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මතක තබාගත යුතුය. අන් අයට හිරිහැර කිරීම් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය කවුන්සිලය අනුගමනය කරන ශූන්‍ය ඉවසීමේ (zero tolerance stance on bullying) ප්‍රතිපත්තියට අනුකූල වීමද මීට අයත් වේ.

එකී අපේක්ෂාවන්ට අමතරව, මෙකී නීතිරීති අනුගමනය කරන ලෙසට ද අපගේ සිසු සිසුවියන් වෙතින් ඉල්ලා සිටිමු.

## මනා හැසිරීම

Virtual පංති වලට සහභාගි වන සියලුදෙනා එකිනෙකා කෙරෙහි ගෞරවයෙන් කටයුතු කළ යුතු වේ. පහත කරුණු සම්බන්ධයෙන් පූර්ණ සහයෝගය ලබදෙන ලෙසට සියලුම සිසු සිසුවියන් වෙතින් අප ඉල්ලා සිටිමු.

- මිත්‍රශීලී වන්න
- සියලුදෙනා ඇතුළත් වන අයුරින් කටයුතු කරන්න - ක්‍රියාකාරකම් වලදී අන් අය එකතු කරගන්න
- සහභාගි වන්න - ගුරුවරයා විසින් කියා සිටින ක්‍රියාකාරකම් වලට සහභාගි වන්න
- ගුරුවරයාගේ උපදෙස් වලට සවන් දී, ඒවා අනුගමනය කරන්න
- අන් අයට සවන්දීමට සහ කතා කිරීමේ අවස්ථාව ඔවුන්ට ද ලබාදීමට කාරුණික වන්න
- තමන්ගේ කැමරාවෙන් පෙන්නුම් කෙරෙන්නේ තමන් පමණක් බවට සහතික වන්න
- යම් කරුණක් පිළිබඳ සතුටට පත් නොවේ නම්, ගුරුවරයාගෙන් උදව් ඉල්ලා සිටින්න නැතිනම්, තමන් විශ්වාස කරන වැඩිහිටියෙකුට ඒ ගැන දන්වන්න.
- සැම විටෙකම කැමරාව ක්‍රියාත්මකව තබන්න.

## කළ යුතු වෙනත් දෑ

- සිසු සිසුවියන් විසින් සිය ගිණුම් සකස් කළ යුතුතේ සිය මුල් නම සම්පූර්ණයෙන් හා වාසගම දැක්වෙන පරිදි වාසගමේ මුල් අකුර (උදා: හුවාන් ආර් හෝ කිම් වයි) යොදාගනිමිනි. පංතියේ නාමලේඛනය හා නොගැළපෙන නමක් සහිත සහභාගිවන්නන් හට පංතිකාමරයට එක්වීමට අවසර නොමැත.

## තහනම් වූ හැසිරීම් රටා

පහත චර්යාවන්ට අවසර නොමැත

- හිරිහැර කිරීම
- හිතාමතා අකීකරුවීම
- අන් අය කෙරෙහි වෙනස්කොට සැලකීම
- කිසිදු භාෂාවකින් නුසුදුසු වචන භාවිතය
- පාඩම් වේලාවේ දී දුරකථනය භාවිතය
- ඇමතුම් වලට බාධා වන මාදිලියේ මෘදුකාංග හෝ මෙවලම් භාවිතය
- නුසුදුසු බවට සැලකිය හැකි දෑ අන් අය හා බෙදා-හදා ගැනීම
- Virtual පංති පටිගත කිරීම
- සිසුවා හැරෙන්නට වෙනත් අය කැමරාවෙන් දිස්වීමට ඉඩ හැරීම
- Virtual පංතිකාමරයේ ඉගෙන ගන්නා අනෙකුත් සිසු සිසුවියන්ට හැර වෙනත් අයට අන් සිසු සිසුවියන් හා සම්බන්ධවීමට ඉඩ හැරීම

ඉහත නීතිරීති වලට අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, ඊට වගකිව යුතු සිසුවා පංතියට සහභාගිවීම තාවකාලිකව නතර කිරීමට හෝ බැහැර කිරීමට හෝ හේතුවනු ඇත.

# **Virtual** පංති සූදානම් කිරීම සඳහා මාර්ගෝපදේශ.

## සූදානම් වන්න!

### ඔබව පෙනෙන ඇසෙන බව තහවුරු කරගන්න

Virtual පාඩම් වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට නම් සිසුවා ට කැමරාවක් ද තිබිය යුතු වේ. ඔබ යම් දිනෙක Skype, FaceTime හෝ වෙනත් විඩියෝ මගින් කතා කිරීමේ යෙදුමක් භාවිත කර ඇත්නම්, මෙය ද බොහෝ දුරට ඒ හා සමාන ය. පංතිය පුරාවට ගුරුවරයා හෝ අනෙක් සිසු සිසුවියන් සමග කතා කිරීම සඳහා Ear/headphones සමග ඒ හා සවි කර ඇති මයික්‍රෆෝනයක් ද අවශ්‍ය වේ.

පංතිය ආරම්භ කිරීමට පෙර, ඔබේ විඩියෝව සහ මයික්‍රෆෝනය නිසි ලෙස ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බලන්න.

## නිශ්ශබ්ද තැනක් තෝරාගන්න

Virtual පංති වල ඇති ලොකුම වාසිය නම්, කොතැන සිට පංතියට සහභාගි වන්නේ ද යන්න තමාට තෝරාගත හැකි වීමයි. වඩාත් හොඳ අත්දැකීමක් ලැබීමට, අන් අයගෙන් සහ ශබ්ද වලින් බාධාවක් ඇති නොවන තැනක් තෝරාගන්න. බාධාවන් ඇති වීම සහ නිතර නිතර සිටින තැන වෙනස් කිරීමට සිදුවීම නිසා ඉගෙනීම සම්බන්ධයෙන් හොඳ අත්දැකීමක් ලැබීමට තමන්ට නොහැකි වනු ඇත.

දුරකථනයක් හෝ ටැබ්ලටයක් වෙනුවට මේසය මත (desktop) හෝ laptop පරිගණකයක් භාවිත කරන්න.

## මනාව සම්බන්ධ වී සිටින්න

ඔබට මනා අන්තර්ජාල සබඳතාවක් තිබීම අත්‍යවශ්‍ය වේ. අන්තර්ජාල සබඳතාව දුර්වල නම්, ගුරුවරයා සහ අන් අය කියන දෑ අසන්නට හා ඔවුන් දකින්නට ඔබට අපහසු වනු ඇත. එය සියලුදෙනාටම අපහසුකාරී වනු ඇත.

- ඉගැන්වීම් මධ්‍යස්ථානය විසින් ලබාදෙන පාඩම් අතරවාරයේ දී මාගේ දරුවා විසින් භාවිත කරන වේදිකාව (platform) සහ සාකච්ඡාවන් අධීක්ෂණය කළ හැකි බව මම අවබෝධ කරගෙන සිටිමි.
- සිසු සිසුවියන් හෝ කාර්ය මණ්ඩලය වෙතින් තොරතුරු, රූප (images) සහ/හෝ විඩියෝ පටිගත කිරීම් ආදී කිසිවක් කිසිදු ආකාරයකින් භාවිතයට මට අවසර නොමැති බව මම අවබෝධ කරගෙන සිටිමි. රහස්‍ය/ පුද්ගලික භාවය සහ ප්‍රකාශන අයිතීන් පිළිබඳ අවශ්‍යතා සම්බන්ධයෙන් මෙම නීතියට අනුකූල විය යුතු බව මම අවබෝධ කරගෙන සිටිමි.

☐ මෙම කොටුවෙහි සලකුණු කිරීම මගින් මාගේ දරුවා සහ මම මෙකී නීතිරීති අනුගමනය කිරීමට එකඟ වේ.